

# අපගේ උද්‍යෝගීමත් අලෙවිකරණ කණ්ඩායම සමඟින් එක්වන්න...!

**දිවයින පුරා පිහිටි අපගේ ශාඛා ජාලය සඳහා අලෙවි විධායකයින් සහ අලෙවි නිලධාරීන් අවශ්‍ය කර තිබේ.**

අපගේ ප්‍රවේශයන් පුළුල් කරමින්, පාරිභෝගික සම්බන්ධතා සවිමත් කිරීමේ තීරණාත්මක කාර්යභාරය ඉටු කිරීමට ඔබටත් අවස්ථාවක්. පුළුල් පරාසයක පවතින අපගේ වත්කම් සහ වගකීම් ආශ්‍රිත නිෂ්පාදන, ප්‍රවර්ධනය කිරීමට සහ අලෙවි කිරීමට සක්‍රීය සහ ක්‍රියාශීලී අලෙවි විධායකයින් සහ අලෙවි නිලධාරීන් සඳහා ඇබෑර්තු ඇත.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී යනු, මහජන බැංකුවෙහි අනුබද්ධිත ආයතනයක් වන අතර, කොළඹ කොටස් වෙළඳපොළෙහි **(CSE)**, ප්‍රධාන පුවරුවේ ලැයිස්තුගත කළ සීමාසහිත දේපළ සමාගමක් වේ. ගෝලීය සන්නාම සඟරාව විසින් ශ්‍රී ලංකාවේ විශ්වාසවන්තම මූල්‍ය ආයතනය ලෙස පිළිගැනීමෙන් පසු, සමාගම වසර හයක් ඇතුළත ලීසිං කර්මාන්තයේ වෙළඳපල නායකත්වය තමා සතු කරගත් අතර, දශකයකට අධික කාලයක් එම විශිෂ්ඨත්වය තහවුරු කර ඇත. රට පුරා 100 කට අධික ශාඛා ප්‍රමාණයක ශක්තිමත් ජාලයක් සහ කැපවූ සේවක කණ්ඩායමකින් සන්නද්ධ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී විවිධ නිෂ්පාදන හා සේවාවන් හරහා පුළුල් පරාසයක මූල්‍ය අවශ්‍යතා සපුරාලමින් සිය පාරිභෝගික සබඳතා අඛණ්ඩව ශක්තිමත් කරයි.

## ප්‍රධාන වගකීම්:

**අලෙවි විධායකයින්:**

සමාගම සතු සියලුම නිෂ්පාදනයන්, පුද්ගලික සහ සමාගම් ගණුදෙනුකරුවන් වෙත ප්‍රවර්ධනය කරමින්, ඔවුන් සමඟ ශක්තිමත් පාරිභෝගික සම්බන්ධතා ස්ථාපිත කර ගැනීම සහ පවත්වාගෙන යාම.
පුද්ගලික සහ සමාගම් ගණුදෙනුකරුවන් යන දෙපාර්ශවය සඳහාම විස්තරාත්මක යෝජනා පත් සකස් කිරීම.
ගණුදෙනුකරුවන් හමුවීම සහ විවිධ ප්‍රවර්ධන කටයුතු හරහා වෙළඳපල අවස්ථා හඳුනා ගැනීම.
ගණුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලන නිෂ්පාදනයන් සංවර්ධනයට සහාය දැක්වීම.

**අලෙවි නිලධාරීන්:**

ගණුදෙනුකරුවන් සමඟ මනා සම්බන්ධතා පවත්වා ගනිමින් සමාගම සතු නිෂ්පාදන හා සේවාවන් ප්‍රවර්ධනය කිරීම.
ගණුදෙනුකරුවන් හමුවීම සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ඔස්සේ වෙළඳපල අවස්ථා හඳුනාගෙන ක්‍රියාත්මක වීම.

## අයදුම්කරුගේ පැතිකඩ:

**අලෙවි විධායකයින්:**

- අවම වශයෙන් වසර 05-06ක අලෙවිකරණ / ව්‍යාපාර සංවර්ධන ක්ෂේත්‍රයේ පළපුරුද්ද, විශේෂයෙන් ලීසිං හෝ බැංකු ක්ෂේත්‍රයේ.
- අලෙවිකරණය / කළමනාකරණය පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.
- මනා සන්නිවේදන කුසලතා.
- වලංගු රියදුරු බලපත්‍රය (වාහන/යතුරුපැදි)

**අලෙවි නිලධාරීන්:**

- අවම වශයෙන් වසරක අලෙවිකරණ / ව්‍යාපාර සංවර්ධන ක්ෂේත්‍රයේ පළපුරුද්ද, විශේෂයෙන් ලීසිං හෝ බැංකු ක්ෂේත්‍රයේ.
- මනා සන්නිවේදන කුසලතා.
- ගණිතයට සම්මාන සාමාර්ථයක් සහිතව අ.පො.ස. (සා.පෙ) විභාගය සමත් වී තිබීම.
- අ.පො.ස. (උ.පෙ) විභාගය, ප්‍රධාන විශයන් තුනක් සමත්ව තිබීම.
- වලංගු රියදුරු බලපත්‍රය (වාහන/ යතුරුපැදි)

**අයදුම් කිරීම සඳහා :**

මෙම දැන්වීම පළ වූ දිනයෙන් දින 7ක් ඇතුළත, අයදුම් කළ තනතුර ඊමේල් විෂයෙහි සඳහන් කරමින් ඔබේ අයදුම්පත **careers@plc.lk** වෙත ඊමේල් කරන්න. සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරාගත් අයදුම්කරුවන් සමඟ පමණක් ඉදිරි තොරතුරු සාකච්ඡා කරන බව කරුණාවෙන් සළකන්න.

**නව්‍යකරණය, කැපවීම සහ විශිෂ්ඨත්වය අගයන කණ්ඩායමක සාඩම්බර කොටස්කරුවෙකු වීමට අප සමඟ එක්වන්න. අනාගතය ඔබ වෙනුවෙන්මයි...!**

PLC PEOPLE'S LEASING
පීපල්ස් ලීසිං | பீப்பள்ஸ் லீசிங்
THE TRUSTED LEADER